Article 13 (1)
13 (2)

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2020-09-15

| | | | |
|---|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | | ආර්.එම්. සමිත් කුමාරන් මහතා,<br>අංක : 44/267, කිරුළපුර,<br>කිරුළපන, කොළඹ 06. |
| වගඋත්තරකරුවන් | : | 01. | උ.පො.ප. ලියනාරච්චි මහතා,<br>පොලිස් ස්ථානය,<br>කොහුවල. |
| | | 02. | පො.කො. 73036 ඉන්දික මහතා,<br>පොලිස් ස්ථානය,<br>කොහුවල. |
| | | 03. | පො.කො. 75707 බණ්ඩාර මහතා,<br>පොලිස් ස්ථානය,<br>කොහුවල. |

<u>පැමිණිලි අංකය : **HRC/3767/15**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත්තේ, තමා ත්‍රිවිල් රියදුරෙකු වන බවත්, 2015.10.21 වන දින පස්වරු 6.00-8.00 ත් අතර කාලයේ කිරුළපන පොලිසිය අසලින් පුද්ගලයෙකු තම ත්‍රිවිල් රථයට ගොඩ වූ බවත්, ගමන අතරතුරදී සරණංකාර පාර අසලදී ත්‍රිවිල් රථය නතර කරන ලෙසට දැනුම්දුන් බවත්, ඉන්පසු එම පුද්ගලයා ත්‍රිවිල් එකෙන් බැස තවත් පුද්ගලයෙක් සමග කතා කොට නැවත ත්‍රිවිල් එකට නැග කිරුළපන ප්‍රදේශයට යන ලෙසට තමාට උපදෙස් දුන් බවත් සඳහන් කර ඇත. ඒ අනුව කිරුළපන ප්‍රදේශයට යන අතරතුරදී සරණංකර පාර පටන් ගන්නා ස්ථානයේ දී යතුරු පැදියකින් පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ත්‍රිවිල් රථය නතර කරන ලෙසට අණ කළ බවත්, ඒ අනුව තමා ත්‍රිවිල් රථය නතර කළ බවත්, එම නිලධාරීන් දෙදෙනා සිවිල් ඇඳුමින් සිටි බවත්, එක් නිලධාරියෙක් පැමිණිලිකරු පරීක්ෂා කළ බවත්, අනෙක් නිලධාරියා ත්‍රිවිලයේ සිටි පුද්ගලයා පරීක්ෂා කරන ලද බවත්, එම පුද්ගලයාගේ සාක්කුවෙන් යම් ද්‍රව්‍යයක් හමුවූ බවත්, බඩු තියෙනවා




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කියා එම නිලධාරියා අනෙක් නිලධාරියාට පෙන්වනවා සමග ත්‍රිවිල් එකේ පැමිණි පුද්ගලයා පැන දිවූ බවත් සඳහන් කර ඇත. එක් නිලධාරියෙක් ඔහු පසුපස ලුහු බැඳ ගිය නමුත්, ඔහුව අල්ලා ගැනීමට නොහැකි වූ බවත්, ඉන්පසුව පැමිණිලිකරු පරීක්ෂා කළ නිලධාරියා සහ අනෙක් නිලධාරියා පැමිණිලිකරුට පහරදුන් බවත්, පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. පසුව එම නිලධාරින් පැමිණිලිකරුව සරණංකර පොලිස් මුරපොලට රැගෙන ගොස් ඇඳුම් ගලවන ලෙසට අණ කළ බවත්, පැමිණිලිකරුගේ මුදල් පසුම්බියේ රු. 13,000/- ක පමණ මුදලක් තිබූ බවත්, පොලිස් නිලධාරින් විසින් පැමිණිලිකරුට බිම දමා පහරදී පැන ගිය අය පොලිසියට භාරදෙන ලෙසට දන්වා සිටි බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු එම පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් නොදන්නා බවට ප්‍රකාශ කර ඒ බව පොලිසියට පැහැදිලි කළ ද, ඔවුන් ඒ සම්බන්ධයෙන් කිසිදු තැකීමක් නොකළ බවද සඳහන් කර ඇත. එසේම, තමා ළඟ තිබූ මුදල ඔවුන්ට ලබාදී බේරී යන ලෙසට එම නිලධාරින් තමාට ප්‍රකාශ කළ බවත්, නමුත් තමා වරදක් නොකළ නිසා එසේ කිරීමට අවශ්‍ය නොවන බවට එම නිලධාරින්ට දැන්වූ බව ද පැමිණිලිකරු සඳහන් කර ඇත. පසුව පැමිණිලිකරුව කොහුවල පොලිසියට රැගන ගිය බවත්, පැමිණිලිකරු බීමත්ව සිටි බවට පවසා බීමත් බව පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් සිදුකර ගංගොඩවිල මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ පසු ඇප ලබාගැනීමෙන් අනතුරුව පැමිණිලිකරු කළුබෝවිල අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත්වී අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට භාජනය වූ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු තවදුරටත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත්තේ, වගඋත්තරකරුවන්ගේ පහරදීම නිසා පැමිණිලිකරුගේ මුහුණ සීරී තිබූ බවත්, තොල් තුවාල වී තිබූ බවත්, මුහුණ ඉදිමී තිබූ බවත්, බෙල්ල උළුක්කු වී තිබූ බවත්ය.

**පැමිණිල්ල තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි :-**

පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාවට අනුව රෝගියා විසින් ලබා දෙනු ලබන කෙටි රෝග ඉතිහාසයේ දක්වා ඇත්තේ, "2015.10.21 වන දින කොහුවල පොලිස් ස්ථානයට අනුයුක්ත සරණංකර පොලිස් මුරපොලේ නිලධාරින් 3 ක් පහරදුන් බවට" වේ. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල තුවාල 9 ක් ඇති බව සඳහන් කර ඇත.

පැමිණිලිකරුට විරුද්ධව වගඋත්තරකරුවන් විසින් ගොනු කර ඇති නඩු අංක : 15946/A නඩුවේ වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එම නඩුව යටතේ බීමත්ව රිය පැදවීම යටතේ නඩු පවරා ඇති බවත්, එම නඩුවෙන් පැමිණිලිකරු නිදොස් කොට ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුට විරුද්ධව නඩු අංක : 9558 යටතේ නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම යටතේ පවරා ඇති නඩුවේ වාර්තාව කොමිෂන් සභාව වෙත ලබාදී ඇති අතර, එම නියෝගය අනුව පැමිණිලිකරුව එම නඩුවෙන් ද නිදහස් කර ඇත.

ඇසින් දුටු සාක්ෂි වශයෙන් කොළඹ 05. කිරුළපන, ධර්මාරාම පුර අංක : 135/31 දරණ ලිපිනයේ පදිංචි මහමුද් සහබ්ඩීන් යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. එම දිවුරුම් ප්‍රකාශය අනුව රාමසාමි මර්දසාමිගේ සමින් කුමාරන් යන අයට සරණංකර පාර පටන් ගන්නා ස්ථානයේදී සිවිල් ඇඳුමින් සිටි මහත්වරුන් දෙදෙනෙක් පහරදුන් බවට තමා දුටු බවත්, ඒ අවස්ථාවේදී එතන සිටි අයෙක් පැන දුවන බවටද තමා දුටු බවත් සදහන් වේ. පසුව ඒ බව තමා කුමාරන්ගේ දෙමාපියන්ටද දැන්වූ බවද සදහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

- 01 වන වගඋත්තරකාර පො.ප. ලියනාරච්චි මහතාගේ ප්‍රකාශය :

ඉහත වගඋත්තරකරු පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ 2015.10.21 වන දින පොලිස් කොස්තාපල් 73036 ඉන්දික සහ 75707 බණ්ඩාර යන අය සමග දූෂණ මර්ධන වැටලීම් රාජකාරි වල නියැලී සිටි බවත්, එහිදී පාමංකඩ හන්දියේ සැක කටයුතු ත්‍රීවිල් රථයක් පරීක්ෂා කිරීමේදී ගංජා මත්ද්‍රව්‍ය හමුවීමෙන් පසුව ගංජා ලග තබා ගැනීම යටතේ පැය 18.10 ට කරුළපුර, කිරුළපන, කොළඹ 06 ලිපිනයේ පදිංචි රාමසාමි සමින් කුමාරන් යන අයව ගංජා ලග තබා ගැනීමේ චෝදනාව යටතේ අත්අඩංගුවට ගත් බවත්ය. අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ බවත්, ඔහු ලග තිබී සොයා ගන්නා ලද ගංජා ග්‍රෑම් 5 ක පැකට්ටුව නඩු භාණ්ඩ ලෙස සටහන් කර පොලිස් ස්ථානයට භාරදුන් බවත් සදහන් කර ඇත. මෙම සැකකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී කළහකාරි ලෙස හැසිරුනු බැවින් සැකකරු සමග පොර බැදීමක් සිදු වූ බවද වැඩිදුරටත් සදහන් කර ඇත.

අනතුරුව 2015.10.22 දින නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 9558 යටතේ සැකකරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, මොහුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී බීමත්ව සිටි බැවින් බීමත්ව රිය පැදවීම සම්බන්ධයෙන් ඇල්කොහොලික් පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධයෙන් ද අධිකරණයට කරුණු වාර්තා කළ බවත් සදහන් කර ඇත.

කොමිෂන් සභාව විසින් වගඋත්තරකරු වෙතින් කරන ලද විමසීම් වලට අනුව පහත කරුණු ඉදිරිපත් කර ඇත.

පහරදීම සම්බන්ධයෙන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පොර බැදීමේදී යම් හානියක් සිදුවූයේ දැයි නොදන්නා බවත්, ඒ සම්බන්ධයෙන් සටහන් අදාළ තොරතුරු සටහන් පොත් වල සටහන් කර ඇති බවත්, එම සටහන් වල පෙනෙන්නට තුවාල නැති බවට දක්වා ඇත බවත් සදහන් කර ඇත..

නවද. අත්අඩංගුවේ සිටියදී පැමිණිලිකරුට පහරදුන් බවට සඳහන් කළත්, පැමිණිලිකරු රෝහල් ගතවී ඇත්තේ 2015.10.23 වන දින බැවින් එම කාලය තුළ කිසියම් දෙයක් සිදුවුයේද යන්න තමා නොදන්නා බැවින්, ඒ සම්බන්ධයෙන් තමාට වගකීමක් නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

- දෙවන වගඋත්තරකාර පො.කො. 73036 පී.එච්.අයි.ජේ. සේනාරත්න මහතාගේ ප්‍රකාශය :-

ඉහත වගඋත්තරකාර නිලධාරී විසින් සිය කරුණු දැක්වීමේදී ප්‍රකාශ කර ඇත්තේ, පො.ප. ලියනාරච්චි මහතා සහ පො.කො. බණ්ඩාර යන අය සමග දූෂන මර්ධන අංශයේ වැටලීම් වල නිරත වී සිටි බවත්, පාමංකඩ හන්දියේ සැක කටයුතු ත්‍රීවිල් එකක් පරීක්ෂා කළ බවත්, ත්‍රීවිල් රථයේ පසුපස සිටි අයට බහින ලෙසට අණකල විට ඔහු පැන දිවූ බවත්, පො.කො.බණ්ඩාර ඔහු පසුපස ලුහුබැද ගියද අල්ලා ගැනීමට නොහැකි වූ බවත්ය. ත්‍රීවිල් රථය පැද ගෙන ආ සැකකරුව පො.ප. ලියනාරච්චි මහතා බෙල්ලට අත දාගෙන පැන නොයන ලෙසට අල්ලාගෙන සිටි බවත්, පසුව නඩු භාණ්ඩ සමග උපසේවයට භාරදුන් බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

- 03 වන වගඋත්තරකාර පො.කො. 75707 එල්.ආර්.ඩී.එන්. බණ්ඩාර මහතාගේ ප්‍රකාශය :-

03 වන වගඋත්තරකරුද කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, ඉහත වගඋත්තරකරුවන් දැක්වූ ආකාරයට 2015.10.21 වන දින වැටලීම් රාජකාරියේ යෙදී සිටි බවත්, පාමංකඩ හන්දිය අසලදී සැකකරුව අත්අඩංගුවට ගත් බවත්, කිසිදු පහරදීමක් සිදුනොකළ බවත්ය.

**නිරීක්ෂණ :-**

අදාල අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල 08 ක් ඇති බවට සඳහන් වන අතර, එම තුවාල පහත පරිදි වන බවට දක්වා ඇත.

01. සීමිත චලනයන් සහිත බෙල්ලේ පිටුපස මෘදු ප්‍රදේශයක් පිහිටා ඇත.
02. 3cm×3cm ප්‍රමාණයෙන් හකු ප්‍රදේශයට පිටුපසින් බෙල්ලට දකුණු පසින් කණ මට්ටමට වන්නට මෘදු ප්‍රදේශයක් පිහිටා ඇත.
03 2cm×2cm ප්‍රමාණයෙන් නලල මැද ඉහළ මෘදු ප්‍රදේශයක් පිහිටා ඇත.
04. 0.5cm සහ 1cm ප්‍රමාණයේ නලල මැද රේඛීය සීරීම් සමූහයක් පිහිටා ඇත.
05. උඩු තොලෙහි ඇතුල් මතුපිටෙහි 0.5cm×0.5cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක්ද.
06. උඩු තොලෙහි ඇතුල් මතුපිටෙහි 1cm×2cm ප්‍රමාණයේ තැලීම් තුවාලයක්ද.
07. 0.7cm×0.7cm ප්‍රමාණයේ යටි තොලෙහි ඇතුල් මතුපිටෙහි තැලීමක්ද.
08. 0.5cm×0.5cm ප්‍රමාණයෙන් 5 වන පාද ඇඟිල්ලෙහි මතුපිටෙහි සීරීමක්ද.

මේ අනුව පැමිණිලිකරු ඔහුට සිදුවූ තුවාල වල ස්වභාවය සහ ප්‍රදේශ සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම අදාළ වාර්තාවට අනුව ගැලපෙන බවට නිරීක්ෂණය වන බැවින්, වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදුකර ඇති බවට අනාවරණය වේ.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ ගංජා ග්‍රෑම් 05 ක් ලග තබාගැනීම සහ බීමත්ව රිය පැදවීම යන චෝදනා මත බවයි. මේ සම්බන්ධයෙන් අධිකරණයේ පැවති නඩු වලදී මෙම පැමිණිලිකරුව එම නඩු වලින් නිදොස් කොට ඇති බවට නඩු වාර්තා වලට අනුව නිරීක්ෂණය වේ. නඩු අංක : 15946/A යටතේ පවරා ඇති බීමත්ව රිය පැදවීමේ නඩුවෙන් පැමිණිලිකරුව මූලින්ම නිදොස් කොට ඇති අතර, ගරු මහේස්ත්‍රාත්තුමාගේ නියෝගයෙන් පෙන්වා දී ඇත්තේ, පොලිසිය විසින් බීමත්ව රිය පැදවීම සම්බන්ධයෙන් සිදුකරන ඇල්කොහොලික් පරීක්ෂණය නිසි ක්‍රියාපටිපාටිය අනුව සිදු කර නොමැති බවයි. ඒ තුලින් නිරීක්ෂණය වන්නේ අත්අඩංගුවට ගැනීම සහ අත්අඩංගුවට ගැනීමෙන් පසුව වගඋත්තරකරුවන් කටයුතු කර ඇත්තේ, නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටි වලට පටහැනිව වන බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු ඇප මත නිදහස් වී ඇත්තේ, 2015.10.22 දින වන අතර, ඔහු රෝහලට ඇතුළු වී ඇත්තේ 2015.10.23 වන දින බැවින්, ඒ අතරතුර කාලයේදී පැමිණිලිකරුට සිදුවන සිදුවීම් වලට තමන් වගකීමට බැදී නොමැති බවයි. නමුත්, ඉදිරිපත් වී ඇති ලේඛන වල සඳහන් තොරතුරු අනුව පැමිණිලිකරු 2015.10.22 වන දින සවස දකුණු කොළඹ ශික්ෂණ රෝහලට ප්‍රතිකාර ලබාගැනීමට ගොස් ඇති බවට නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරුට විරුද්ධව ගංජා ග්‍රෑම් 05 ක් ලග තබාගැනීම සම්බන්ධයෙන් නඩු අංක : 9558 යටතේ පවරා ඇති නඩුවේ නියෝගය අනුව වගඋත්තරකරුවන් මූලින්ම සාක්ෂි දී ඇත්තේ වැටලීම් සඳහා නිලධාරීන් 05 දෙනෙක් සහභාගී වූ බවට වන අතර, පසුව වැටලීම් වලට සහභාගී වූ නිලධාරීන් 03 ක් බවට සඳහන් කර සාක්ෂි ලබාදී ඇති බැවින්, එම සාක්ෂි පරස්පර බව සඳහන් කර ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශ සම්බන්ධයෙන් ද ගැටළු පවතින බවට නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරු සිය පැමිණිල්ලෙන් දක්වා ඇති තුවාල සහ එය සිදුවූ ආකාරය අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල හා සැසඳෙන අතර, ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු සහ ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මගින් පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට කරුණු තහවුරු වී ඇත.

එසේම, පැමිණිලිකරුට 2015.10.22 වන දින ඇප ලැබී ඇති බවත්, අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත්තේ 2015.10.23 වන දින බැවින් එම කාලය තුළ වගඋත්තරකරුවන්ට වගකීමක් නොමැති බවට ඔවුන් කරුණු ඉදිරිපත් කළ ද, අංක : 55480 දරණ රෝගියා පිළිබඳ විස්තරය සඳහන් පත්‍රිකාව අනුව

පැමිණිලිකරු ප්‍රතිකාර සඳහා 2015.10.22 වන දින කළුබෝවිල රෝහලට ගොස් ඇති බවට තහවුරු වන බැවින් අදාළ චෝදනා වලින් වගඋත්තරකරුවන්ට මිදීමේ හැකියාවක් නොමැති බව කොමිෂන් සභාවේ නිගමනය වේ.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික වශයෙන් පිළිගනු ලබන සහ ප්‍රකාශයට පත් කරනු ලබන ඇතැම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ඒවා 1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ III වන පරිච්ඡේදයේ දක්වා ඇති වෙනත් අයිතිවාසිකම් වලට සමාන වන අතර. ඒවා ඉතා විශේෂ ස්වභාවයේ අයිතිවාසිකම් වේ. එනම්. කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට මෙම ව්‍යවස්ථාව මගින් විධානයක් සලස්වයි.

<u>වේල්මුරුගේසු එදිරිව තිතිපති සහ තවත් අය (1981) 1 SLR 406</u> නඩුවේදී වනසුන්දර විනිසුරුතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළ නිරීක්ෂණ දක්වා ඇත. වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව ලබාදෙන 11 වන ව්‍යවස්ථාවේ වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක්ද අවශ්‍ය වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එසේ සඳහන් වන එකම මූලික අයිතිවාසිකම එය පමණක් වීම තුළින් මෙම ව්‍යවස්ථාවේ සුවිශේෂත්වයක් පෙන්නුම් කරයි. එම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ දක්වා ඇති අයිතිවාසිකම් ලැයිස්තුවේ සෑම පුද්ගලයෙකුට සමානව අදාළ වන්නා වූද. කිසිදු ආකාරයකින් සීමා කළ නොහැකි හෝ අඩු කළ නොහැකි වූද. එකම අයිතිවාසිකම වේ. වෙනත් අයිතිවාසිකම් සම්බන්ධයෙන් යම් කෙනෙකු කුමක් පැවසුවද මෙම අයිතිවාසිකම නිසැකයෙන්ම ප්‍රමුඛ ස්ථානයක රැඳී සිටී. මෙම ව්‍යවස්ථාවේ වැදගත්කම එහි බලපෑම සමාජයට ඇති ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේදී එය නිවැරදිව විශේෂ සැලකිල්ලක් දැක්වීම සඳහා වෙන්කොට ගත යුතුය. එම නිසා මෙම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී එහි විධිවිධාන උපරිම ආකාරයෙන් අදාළ කරගැනීම අධිකරණයේ කාර්යභාරයයි.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු (1987) 2 SLR 119 නඩුවේද</u> දක්වා ඇත්තේ. කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම. 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්. කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම. එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක්ද බවයි. එසේම. අපරාධකරුවෙකු වුවද. එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්. මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම. අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවත් දක්වා ඇත.

ලංදගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලාංගනී එරෙහිව වරුණි බෝගහවත්ත සහ වෙනත් අය SC(FR) Application No 677/2012 නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තීව්‍ර කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතු බවයි.

එසේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව 1994 අංක 22 දරණ වධහිංසා සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට ලක්වීමට එරෙහි සම්මුති පනත මගින් දඩුවම් ආකාරයේ වධහිංසාවක් හෝ පුද්ගලයින්ව කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට ලක් කිරීම තහනම් කරයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ 5 වන වගන්තිය යටතේ ද කිසියම් පුද්ගලයෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික පහත් සැලකිල්ලකට හෝ දඬුවමට භාජනය නොකළ යුතු බවට අවධාරණය ර ඇත.

එසේම, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 7 වන වගන්තියේ ද වධදීම හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමකට හෝ දඬුවමකට එරෙහි සම්මුතිය යටතේ ද කෲර හා වධහිංසාවකට ලක්කිරීම නොකළ යුතු බවට අවධාරණය කර ඇත.

ඒ අනුව බලනකල වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සහ නඩු පැවරීම ද සිදුකර ඇත්තේ, නීතියෙන් නියම කර ඇති ආකාරයට පටහැනිව බවට තහවුරු වන අතර, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති 13(1) ව්‍යවස්ථාව යටතේ යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීම සිදුකළ යුත්තේ නීතියෙන් නියම කර ඇති ආකාරයට වන අතර, 13(2) යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙක් රඳවා තබා ගත යුත්තේ ද නීතියෙන් නියම කර ඇති ආකාරයට වේ. ඒ අනුව වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම නීතියෙන් නියම කර ඇති ආකාරයට බාහිරව සිදුකර ඇති බවට තහවුරු වන බැවින් පැමිණිලිකරුගේ එම මූලික අයිතිවාසිකම ද උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිල්ලක් විමර්ශනය කිරීමෙන් අනතුරුව පනතේ 15 වන වගන්තිය යටතේ යම් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය

කිරීමක් හෙළිදරව් වී ඇති බැවින් වගඋත්තරකරුවන්ට එරෙහිව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

01. ඒ අනුව සියළු වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු. 50,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. තවද, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති වෙත සහ පොලිස් කොමිෂන් සභාව වෙත ද යොමු කරනු ලැබේ.

2020- 10-19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත = 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

B/ශ